සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

11 S I

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 10 - 2019

**නම/විභාග අංකය : ............................................ බුද්ධ ධර්මය - I කාලය : පැය 01යි.**

වැදගත් :

- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- ✳ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(01) බුදු දහමෙහි ඇත්ත ඇති සැටියෙන් දකින නුවණ හඳුන්වා ඇත්තේ,
(1) ශ්‍රද්ධා යනුවෙනි. (2) අවෙච්ච ප්‍රසාද යනුවෙනි.
(3) පඤ්ඤා යනුවෙනි. (4) ශික්ෂා යනුවෙනි.

(02) විපස්සනා හෙවත් විදර්ශනා යන්නෙන් අදහස් වන්නේ,
(1) ප්‍රසන්න යැයි ප්‍රනීත යැයි දැකීමයි. (2) යථාර්ථය මනා නුවණින් විශේෂයෙන් දැකීමයි.
(3) පිළිවෙළින් ගමන් කරන ආකාරය දැකීමයි. (4) සිහි නුවණින් වැඩ කිරීම පිළිබඳ දැකීමයි.

(03) සමථ භාවනාවෙන් සිදු වන්නේ,
(1) කෙලෙස් නිදහසේ ක්‍රියා කිරීමට ඉඩ දීමයි. (2) කෙලෙස් සම්පූර්ණයෙන් ඉවත් කිරීමයි.
(3) කෙලෙස් තීව්‍ර කිරීමයි. (4) කෙලෙස් යටපත් කිරීමයි.

(04) ව්‍යාධි යන්නෙහි සරල අදහස වන්නේ,
(1) රෝග පීඩාවන්ට ලක්වීම ය. (2) ජීවිතය අවසන් වීම ය.
(3) මහලුව දිරාපත් වීම ය. (4) සසර නැවත නැවත ඉපදීම ය.

(05) ''වේදනා ස්කන්ධය'' බුදුදහම විස්තර කරන්නේ
(1) සිත් තුළ උපදින සටහන් ලෙස ය. (2) වින්දනය, විඳීම ලෙස ය.
(3) චේතනා, රැස් කිරීම් ලෙස ය. (4) කය, භෞතික සැලැස්ම ලෙස ය.

(06) ''ස්කන්ධ'' යන වචනයට නොගැළපෙන වචනය තෝරන්න.
(1) ගොඩවල් ය. (2) සමූහය ය.
(3) රාශිය ය. (4) ස්ථිරය ය.

(07) වයස අවුරුදු 16යේ දී වැලිවිට සරණංකර හිමියන් පැවිදි වූ විහාරය වූයේ,
(1) මහනුවර මල්වතු මහා විහාරයේ ය. (2) මහනුවර දෙගල්දෝරුව රජ මහා විහාරයේ ය.
(3) මහනුවර සූරියගොඩ විහාරයේ ය. (4) මහනුවර අස්ගිරි මහා විහාරයේ ය.

(08) ''තද ගතිය'' බුදුදහමෙහි දක්වෙන්නේ,
(1) ආපෝ ගතිය ලෙස ය. (2) පඨවි ගතිය ලෙස ය.
(3) තේජෝ ගතිය ලෙස ය. (4) වායෝ ගතිය ලෙස ය.

(09) වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථයක් නොවන්නේ,

(1) බුදුගුණාලංකාරය ය. (2) මුණිගුණාලංකාරය ය.

(3) රත්නත්‍රය ප්‍රණාම ගාථා සන්න ය. (4) සතර බණවර සන්න ය.

(10) දුටුගැමුණු රජතුමා රාජ්‍ය කළ වසර ගණනට ම සමානව වෙසක් උත්සවය ද උත්සවත් සිරියෙන් කරනු ලැබූ බව සඳහන් ය. එතුමා විසින් කළ වෙසක් උත්සව ගණන,

(1) විසි අටකි. (2) තිස් දෙකකි.

(3) විසි දෙකකි. (4) විසි හතරකි.

(11) වැලිවිට අසරණ සරණ සරණංකර මා හිමියන් වෙත සඟරජ පදවිය පිරිනැමූ රජු වන්නේ,

(1) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය. (2) කීර්ති ශ්‍රී මේඝ වර්ණ රජතුමා ය.

(3) ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා ය. (4) පරාක්‍රමබාහු රජතුමා ය.

(12) මසුන් නැති විලක් අසල ලතැවෙන කොස්වා ලිහිණියෙකු උපමා කර බුදුරදුන් දේශනා කළ ධම්ම පද ගාථාවේ මුල් පදය කුමක් ද?

(1) මනෝ පුබ්බංගමා ධම්මා ... (2) නහී වේරේන වේරානි ....

(3) අචරිත්වා බ්‍රහ්ම චරියං... (4) සුකරානි අසාදූනි....

(13) ධනධාන්‍යාදී භෝග සම්පත් වැඩි දියුණු වීම හා කීර්ති ප්‍රශංසාවන් ද වැඩි දියුණු වීම දක්වෙන්නේ,

(1) අත්ථි සුඛ යනුවෙනි. (2) භෝග සුඛ යනුවෙනි.

(3) යසස් වර්ධනය යනුවෙනි. (4) අණන සුඛ යනුවෙනි.

(14) මහත් වූ භෝග සම්පත් ඇතිවීම, කීර්තිය පැතිරීම, නිර්භීතව මුහුණ දීම, සිහිමුලා නොවීම ආදී ආනිසංස පහක් ලැබෙන්නේ,

(1) භාවනා කිරීමෙන් ය. (2) සිල් රැකීමෙන් ය.

(3) නුවණැතිව කටයුතු කිරීමෙන් ය. (4) නොපසු බස්නා වීර්ය නිසා ය.

(15) පාප මිත්‍ර සේවනය හා නොමනා පුරුදුවලට ඇබ්බැහි වී උපයා ගත් සියල්ල විනාශ කර ඇඳිවතට පමණක් සීමා වූ බුදුන් රදුන් ජීවමාන කාලයේ සිටි සිටු පුත්‍රයා කවු ද?

(1) මහධන සිටු පුත්‍රයා (2) ආනන්ද සිටු පුත්‍රය

(3) අනේපිඬු සිටු පුත්‍රයා (4) ජේත සිටු පුත්‍රයා

(16) භෝග විනාශයට හේතු වන කරුණු හයක් ඉදිරිපත් කරන සූත්‍රය වන්නේ,

(1) කරණීය මෙත්ත සූත්‍රය (2) රතන සූත්‍රය

(3) මංගල සූත්‍රය (4) සිගාලෝවාද සූත්‍රය

(17) යම් ක්‍රියාවකට නුවණැති අය නින්දා කරත් නම් එබඳු කුඩා වූ වරදකින් පවා වැලැකීමට උත්සාහ කළ යුතු යැයි උපදෙස් දෙන දේශනාව ඇතුළත් වන්නේ,

(1) මෙත්තානිසංස සූත්‍රයේ ය. (2) ගිරිමානන්ද සූත්‍රයේ ය.

(3) කරණීය මෙත්ත සූත්‍රයේ ය. (4) පරාභව සූත්‍රයේ ය.

(18) මරණාසන්න මොහොතේ දී සුගතියම දක සිහිනුවණින් යුතුව කලුරිය කළ පුද්ගලයකු පිළිබඳ බුද්ධ කාලයේ ප්‍රකට ය. ඔහු

(1) ධම්මික නම් උපාසකයා ය. (2) බ්‍රහ්මදත්ත නම් බමුණා ය.

(3) චුන්ද සූකරික නම් පුද්ගලයා ය. (4) ජීවක නම් පුද්ගලයා ය.

(19) දුශ්ශීලව නොසන්සුන් සිත් ඇති ව අවුරුදු සීයයක් ජීවත් වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇති ව එක දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨ ය. මෙම අදහස ගෙන දෙන ධම්ම පද ගාථාව වන්නේ,

(1) අත්තනාව කතං පාපං - අත්තනා සං කිලිස්සති යනුවෙනි.

(2) යෝචේ වස්ස සතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ යනුවෙනි.

(3) අක්කොච්චි මං අවධි මං - අජිනි මං අහාසිමේ යනුවෙනි.

(4) න තං කම්මං කතං සාධූ - යං කත්වා අනුතප්පති යනුවෙනි.

(20) නීවරණ ධර්ම ලෙස දක්වෙන්නේ,
- (1) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ය.
- (2) කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ද, උද්දච්ච කුක්කුච්ච, විචිකිච්ඡා ය.
- (3) රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ෂ ය.
- (4) චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය ය.

(21) තමාගේ අභිමතය පරිදි සාර මසක් මුළුල්ලේ භාවනා කොට ප්‍රතිඵල නො ලැබූ සැරියුත් හිමියන්ගේ ගෝල නම වූයේ,
- (1) චුල්ලපන්ථක නම් හිමි නම ය. (2) ඡන්න නම් හිමි නම ය.
- (3) වක්කලී නම් හිමි නම ය. (4) ස්වර්ණකාර නම් හිමි නම ය.

(22) බුද්ධානුස්සති භාවනාව අදාළ වන භාවනාව වන්නේ,
- (1) සමථ භාවනාව ය. (2) විපස්සනා භාවනාව ය.
- (3) ආනාපාන සති භාවනාව ය. (4) මෛත්‍රිය භාවනාව ය.

(23) සිදුහත් බෝසතාණෝ කිං කුසලගවේසී ව සිටි කාලයේ දී හමු වුණු ආලාරකාලාම තවුසා ලබා තිබූ ධ්‍යානය වූයේ,
- (1) අෂ්ට සමාපත්ති ධ්‍යානයයි. (2) පඤ්ච අභිඥා ධ්‍යානයයි.
- (3) සප්ත සමාපත්ති ධ්‍යානයයි. (4) ඉහත සියලු ධ්‍යානයන් ය.

(24) ශීලය යනු ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ,
- (1) සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා අනුව හික්මීමයි.
- (2) සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීවය අනුව හික්මීමයි.
- (3) සම්මා සති, සම්මා සමාධි, සම්මා වායාම අනුව හික්මීමයි.
- (4) සම්මා වාචා, සම්මා සති, සම්මා සමාධි අනුව හික්මීමයි.

(25) සන්තුට්ඨිතා යනු,
- (1) ඍජු ගුණාංගයෙන් යුක්ත වීම ය. (2) පසිඳුරන් සංවර කර ගැනීම ය.
- (3) සිවු ඉරියව්වල අවබෝධයෙන් යුක්තවීම ය.(4) ලද දෙයින් සතුටු වීම ය.

(26) කුසල් දම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි. මෙහි පාලි පාඨය තෝරන්න.
- (1) භාවේති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායතානි.
- (2) චිත්තං සමේතීති සමථෝ
- (3) විසේසේන පස්සතීති විපස්සනා
- (4) දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං

(27) අතීත පැවැත්ම, අනාගත පැවැත්ම, අතීත හා අනාගත පැවැත්ම ආදිය පිළිබඳ සිතේ සැකය හෙවත් වැනෙනසුළු තත්වය හැඳින්වෙන්නේ,
- (1) කාමච්ඡන්ද යනුවෙනි. (2) විචිකිච්ඡාව යනුවෙනි.
- (3) ථීන මිද්ධය යනුවෙනි. (4) උද්ධච්ච කුක්කුච්ච යනුවෙනි.

(28) බුදුදහම විස්තර වන තැන්හි ව්‍යාපාදය උපමා කර තිබෙන්නේ,
- (1) උතුරණ ජලයට ය. (2) ජලයෙහි පාසිවලට ය.
- (3) බොර ජලයට ය. (4) කැළඹුණු ජලයට ය.

(29) ස්වාමීනි, මම බොහෝ දේ පාඩම් කර ඇත්තෙමි. එහෙත් දැන් ඒවා මතකයට නගා ගත නොහැකි ය. එයට හේතුව කුමක් දැයි බුදුරදුන්ගෙන් විමසුවේ,
- (1) එක්තරා භික්ෂුවක් ය. (2) එක්තරා දෙවියෙක් ය.
- (3) එක්තරා බමුණෙක් ය. (4) එක්තරා රජදරුවෙක් ය.

(30) අකුසල මූල ලෙස බුදුදහම දක්වන්නේ,
- (1) සීල, සමාධි, ප්‍රඥා වශයෙන් ය. (2) අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් ය.
- (3) අලෝභ, අදෝස, අමෝහ වශයෙන් ය. (4) ලෝභ, දෝස, මෝහ වශයෙන් ය.

(31) තෙරුවනෙහි ''සූවිසි ගුණය'' යනු

(1) ගුණ විසි දෙකකි. (2) ගුණ විසි තුනකි.

(3) ගුණ විසි හතරකි. (4) ගුණ විසි පහකි.

(32) මහා සංසරත්නය සුරකින ප්‍රතිපත්ති අන්තර්ගත පිළිතුර තෝරන්න.

(1) ආජීව අෂ්ටමක සීලය හා දස සීලය.

(2) පන්සිල් හා දස සීලය.

(3) ආජීව අෂ්ටමක සීලය හා උපසම්පදා සීලය.

(4) උපසම්පදා සීලය හා දස සීලය.

(33) සාංසාරික අභියෝග ජයගත හැකි බව කුමරුට අවබෝධ වූයේ,

(1) සතර පෙර නිමිති දැකීමෙනි. (2) මහා අභිනිෂ්ක්‍රමණය කිරීමෙන් පසුව ය.

(3) අනෝමා ගං තෙරදී ය. (4) සටිකාර සිවුරු පිරිකර දෙන අවස්ථාවේ දී ය.

(34) ''ආමිස ප්‍රතිපත්ති'' යනුවෙන් දැක්වෙන්නේ,

(1) සිල් රැකීම ය. (2) දන්දීම ය.

(3) භාවනා කිරීම ය. (4) මෛත්‍රී කිරීම ය.

(35) තමා විසින් ම පිළිපැද, ඇස් පනා පිට මෙලොව දීම ප්‍රතිඵල දක ගත හැකි බැවින් ධර්මය,

(1) සුපටිපන්න ය. (2) උජුපටිපන්න ය.

(3) ඤාය පටිපන්න ය. (4) සන්දිට්ඨික ය.

(36) ''ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ'' යන ගාථාව ඇතුළත් වන්නේ,

(1) රාහුලෝවාද සූත්‍රය තුළ ය. (2) වාසෙට්ඨ සූත්‍රය තුළ ය.

(3) අරුණාවතී සූත්‍රය තුළ ය. (4) පරාභව සූත්‍රය තුළ ය.

(37) අංගුලිමාල පිරිත දේශනා කර ආශිර්වාද ලබා දෙනු ලබන්නේ,

(1) අසාධ්‍ය රෝගීන්ට ය. (2) ගර්භනී මව්වරුන්ට ය.

(3) ගෙට ගෙවදීමේ නිවැසියන්ට ය. (4) සර්ව රාත්‍රී පිරිත් දේශනයකදී නිවැසියන්ට ය.

(38) මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති. මෙවැනි ස්වාමියෙක් ඇති බිරිය ද නිවීම ලැබ සිටින්නියකි, යනාදී නිබ්බුත පද සිදුහත් කුමරුන්ට කියනු ලැබුවේ,

(1) උත්පලවන්නා නම් වූ කුමරියකි. (2) යසෝදරා නම් කුමරියයි.

(3) කිසාගෝතමී නම් ශාක්‍යකුමරිය (4) මල්ලිකා නම් තරුණ කුමරියයි.

(39) ''රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං'' යනුවෙන් සිද්ධාර්ථ බෝසතානන්ගේ මුවින් පිට වූ එම වදන්වල අදහස වන්නේ,

(1) අලුත උපන් කුමරාගේ නම රාහුල යන්න ය.

(2) රාහුල නම් කුමරෙකු උපන් බව ය.

(3) රාහුල නම් කුමරා ශාක්‍ය රජ පවුලේ ලාබාලයා බවට ය.

(4) රාහුලයෙක් උපන්නේ ය. බන්ධනයක් හට ගත්තේ ය යන්න ය.

(40) නීති ශාස්ත්‍රය කඩු ශිල්පය, දුණු ශිල්පය හා ඇතුන් අසුන් හැසිරවීම ආදී සිප් සතර මැනවින් සිදුහත් කුමරුන්ට ඉගැන්වූයේ,

(1) සර්ව මිත්‍ර නම් බමුණු පඬිවරයා ය. (2) අලාර කාලාම ගුරුතුමා ය.

(3) උද්දකරාම පුත්ත ගුරුතුමා ය. (4) භාර්ගව නම් ගුරුතුමා ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

11 | S | II

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
# First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : ............................................ බුද්ධ ධර්මය - II කාලය : පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, සෙසු ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) වෙනත් කිසිදු උපතක දක්නට නොලැබුණු, සිදුහත් උපත සිදු වූ විගස සිදු වූ අපූර්ව සිදුවීම් දෙකක් ලියන්න.

(ii) සංඝරත්නයේ ගුණ දෙකක් නම් කරන්න.

(iii) ''චිත්තං සමේතීති සමථෝ'' මෙම පාඨයේ අර්ථය ලියන්න.

(iv) ''උඩඟු නොව මහණ'' යන පාඨය පිවිසුම් දොරටුවේ ලියා තිබූ යතිවරයා නම් කරන්න.

(v) දුටුගැමුණු රජු විසින් ගොඩනැගූ ආගමික ගොඩනැඟිලි දෙකක් නම් කරන්න.

(vi) සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමරුට වාසය කිරීමට ඉදි කර දුන් මාළිගා තුන නම් කරන්න.

(vii) ''යෝ චේ වස්සසතං ජීවේ'' මෙම ගාථාව අන්තර්ගත ග්‍රන්ථය වන්නේ කුමක් ද?

(viii) සිත කිළිටි කරන නීවරණ ධර්ම අතරින් දෙකක් ලියන්න.

(ix) බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න.

(x) යම් පුද්ගලයෙකුට සිල් රැකීමෙන් පරලොවදී ලබා ගත හැකි ප්‍රතිඵල කුමක් ද? (2 x 10 = 20)

(02) (i) ''අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ'' මෙහි අර්ථය ලියන්න.

(ii) සිදුහත් කුමරුට මුහුණ දීමට සිදු වූ අභියෝග තුනක් ලියන්න.

(iii) අධ්‍යාපන කටයුතු සාර්ථක කරගැනීම සඳහා සිදුහත් බෝසත් චරිතය කෙතෙක් දුරට ප්‍රයෝජනවත් වේ දැයි පැහැදිලි කරන්න. (2 + 3 + 5)

(03) (i) ''ආරභථ නික්ඛමථ'' යන ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගැයීමට ලක් කරන්න.

(2 + 3 + 5)

(04) (i) භික්ෂූන් වහන්සේ වෙතින් සිදු වන සමාජ සේවාවන් දෙකක් නම් කරන්න.

(ii) ඉහත දක් වූ කරුණුවලින් එක් කරුණක් පැහැදිලි කරන්න.

(iii) සංඝරත්නය රැකගැනීමෙන් බුදු සසුනේ පැවැත්මට සිදු වන යහපත විස්තර කරන්න.

(2 + 3 + 5)

(05) (i) භාවනා කළ හැකි සතර ඉරියව් නම් කරන්න.

(ii) සමථ භාවනාව වැඩීමෙන් දෛනික ජීවිතයට ලද හැකි ප්‍රයෝජන තුනක් ලියන්න.

(iii) විපරීත මනස සන්සුන් කරගැනීමට භාවනාව කෙතෙක් දුරට ප්‍රයෝජනවත් වේ දැයි පැහැදිලි කරන්න.

(2 + 3 + 5)

(06) (i) විරමණය හා සමාදානය යන පදයන්හි අර්ථ දක්වන්න.

(ii) මෙලොවදීම සිල්වතාට අත්දැකීම් වශයෙන් ලබා ගත හැකි ආනිසංස තුනක් ලියන්න.

(iii) ''සිල්වත්කමින් පුද්ගල සංවර්ධනය මෙන් ම සමාජ සංවර්ධනය ද සිදු වේ.'' පැහැදිලි කරන්න.

(2 + 3 + 5)

(07) (i) පහත සඳහන් මාතෘකා අතුරෙන් **<u>දෙකකට</u>** කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට සරණංකර මාහිමි

(ii) විදර්ශනා භාවනාව

(iii) අරහං ගුණය

(iv) ත්‍රිලක්ෂණය (5 x 2 = 10)